# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2014-07-31

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

1. නගර සභා ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

ඌව පළාත් සභාව මේ වන විට විසුරුවා ඇති අතර අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයට එම පළාත් සභාවත් විශිෂ්ට ලෙස ජයග්‍රහණය කර ඉදිරි වසර 05 ක කාලයද ජනතාවට සේවය කිරීමට ධෛර්ය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර විදේශ සියළු බලවේග අඩපණ කර ගැනීමට කටයුතු කරන ලෙස ද ගරු සභාපතිතුමන් විසින් දන්වා සිටින ලදි.

2014 අයවැය යෝජනා යටතේ ආර්ථික සංවර්ධන ගරු ඇමති බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපාදන වලින් විශාල මුදල් ප්‍රමාණයක් බළන්ගොඩ ප්‍රදේශයට ලැබී ඇති බවද, ජනසභා යෝජනා හා මන්ත්‍රීවරුන්ගේ යෝජනා යටතේ බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා එම මුදල් වැය කරන බවද, යම් යම් ග්‍රාමසේවා වසම් වලට අදාළ යෝජනා අනුමත නොවීම තුළ අසාධාරණයක් සිදුව ඇති නමුත් භාණු මුණසිංහ ගරු ඇමතිතුමා සමග සාකච්ඡා කර එම සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද ලබාගෙන අවශ්‍ය සංවර්ධනය එම ප්‍රදේශවල ජනතාවට ලබාදෙන බවද එතුමන් විසින් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි.

එසේම වසර පුරා එකතුවන වරිපනම් බදු හා අනෙකුත් ආදායම් වලින් එක් මන්ත්‍රීවරයෙකුට ලක්ෂ දෙකහමාර බැගින් ප්‍රතිපාදන ලබාදුන් බවද, බහුතර මන්ත්‍රී පිරිසක් එම ප්‍රතිපාදන සංවර්ධන කටයුතු සඳහා යොදවා ඇති බව ද, 2013 අයවැය ඉදිරිපත් කිරීමේදී රුපියල් කෝටි 300 ක පමණ සංවර්ධන කාර්යයන් නිමකරවා තිබූ බවද, පසුගිය සභාවන් වලදී ගන්නා ලද තීන්දු තීරණ අනුව ඉදිරි සංවර්ධන කාර්යයන් නිමකර ජනතාවට සේවය සැලසීමට කටයුතු කරන බවට ද ගරු සභාපතිතුමන් විසින් දන්වා සිටින ලදි.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

සමාලෝචන කිසිවක් ඉදිරිපත් නොවුණි.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එසේම තවත් මාර්ග කීපයක් ඉදිරියේ දී සංවර්ධනය කිරීමට බලාපොරොත්තු බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි.

එසේම PS Tyre Works හිමිකරුගේ නිවසට යන මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා යෝජනා වුවත් එය ඇතුළත් කර නොමැති බවට නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් විමසා සිටින ලද අතර එයට පිළිතුරු ලෙස තෙවන කාර්තුවේ ඉටු කිරීමට සඳහා ඇති සංවර්ධන කාර්යයන් පෙළගස්වා ඇති බවත් ඉහත මාර්ගයද එයට ඇතුළත් කර ඇති බවත් ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි. එසේම කුමාරගම මාර්ගය අළුත්වැඩියාව සඳහා මුදල් ලැබී ඇතිබවද ප්‍රකාශ කරන ලදි.

එසේම වීරසුන්දරාරාම මාවත අළුත්වැඩියාව සම්බන්ධයෙන් නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමන් විසින් විමසන ලද අතර එම මාර්ගය අළුත්වැඩියා කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත ලබාදී ඇති බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය සඳහා අවසර ලබාගැනීම - ශක්ති යොවුන් පදනම

ශක්ති යොවුන් පදනම විසින් සංවිධානය කරනු ලබන වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2014 අගෝස්තු මස 27 සිට 31 දින දක්වා බළන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ දී පැවැත්වෙන අතර, තැන්පත් මුදල් ලෙස රු. 50000 ක මුදලක් ලබාගැනීමටත් සැණකෙළිය පැවැත්වෙන දිනයන් සඳහා දිනකට රු. 4000 ක් බැගින් අය කිරීමටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.
එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් අදහස් ඉදිරිපත් විය.

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා***

*බළන්ගොඩ වෙළඳුන්ට ප්‍රමුඛතාවය ලැබෙන අයුරින් විවෘත වෙළඳකුටි අලෙවි කිරීම සඳහා කොන්දේසියක් පැනවීම සුදුසු බවට අදහස් පළ කරන ලදි.*

*ඒ සඳහා සලකා බලන බවට ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.*

එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය සඳහා අය කරන විනෝද බද්ද අඩු කරන ලෙස ඉල්ලීම - ශක්ති යොවුන් පදනම

ශක්ති යොවුන් පදනම විසින් සංවිධානය කරනු ලබන වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2014 අගෝස්තු මස 27 සිට 31 දින දක්වා බළන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ දී පැවැත්වෙන අතර, මේ සඳහා අය කරන 25% විනෝද බද්ද අඩු කර ගැනීමට කර තිබූ ඉල්ලීමට අනුව මෙම සැනකෙළිය ටිකට්පත් අලෙවි කර ප්‍රදර්ශනය කරන බැවින් විනෝද බද්ද නිදහස් නොකිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:03 කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය නිසා ජන ජීවිතයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳව දැනුම්දීම - එපිටපැත්ත ගම්වාසීන්

බළන්ගොඩ නගර සභාවේ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය නිසා ජන ජීවිතයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳව එපිටපැත්ත ගම්වාසීන් විසින් කරන ලද දැනුවත් කිරීම ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලද අතර ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය පිළියම් යොදා ඇති බව ගරු සභාවට දන්වන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් අදහස් ඉදිරිපත් වූවත් ඒ සඳහා මහා සභාවේ එකඟතාවය පළ කරන ලදි.

***ගරු සභාපතිතුමා***

*ඉහත ලිපියෙහි සඳහන් කරුණු පරීක්ෂා කර බලා අවශ්‍ය පිළියම් සිදුකළ බවත්, නයිට් සොයිල් ව්‍යාපෘතියේ සිදුව පවතින යම් යම් දුර්වලතා නිසා ගලි බවුසරයේ සේවය සීමාකර ඇති බවත්, රෝහල් අපද්‍රව්‍ය කිසියක් ලබා නොගන්නා බවත්, ප්‍රදේශවාසීන්ට සිදුවන අපහසුතා අවම කර ඇති බවත්, නමුත් තවත් කිහිපදෙනෙකුට හෝ අපහසුතාවයක් සිදුවන්නේ නම් ඒවාද අවම කිරීමට කටයුතු කරන බවද, ජල කාණුවේ ජලය නොබසින ස්ථාන සකස් කිරීමට ලක්ෂ 10 ක ඇස්තමේන්තු ගත මුදලක් වෙනුවෙන් පළාත් සභාවට ව්‍යාපෘති වාර්තාවක් සකසා යවා ඇති බවද ඒ අනුව මුදල් ප්‍රතිපාදන ලැබූ වහාම අළුත්වැඩියා කටයුතු අරඹන බවද, යම් දුර්වලතාවයන් ඇත්නම් ඒවා අවම කරගැනීමට සියළුම මන්ත්‍රීවරුන්ගේ හා නිලධාරීන්ගේ සහයෝගය අවශ්‍ය බවද, මෙය අසාර්ථකා ව්‍යාපෘතියක් නොව සාර්ථක ව්‍යාපෘතියක් බවද ගරු සභාපතිතුමන් විසින් දන්වා සිටින ලදි.*

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඇති වී තිබූ ගැටළු පිළිබඳ ගරු සභවේදී සාකච්ඡාවට ගන්නා ලද්දේ කිසිම පුද්ගලයෙකු අපහසුතාවයට පත් කිරීමේ චේතනාවෙන් නොවන බවත්, යම් පිරිසක් පැමිණ කළ දැනුවත් කිරීමක් නිසා බවත්, කළ යුතු සුදුසුම ක්‍රියාමාර්ගය ලෙස මහා සභාව දැනුවත් කිරීම තුළින් විවෘත සංවාදයකට ගොස් අදාළ ගැටළුවට විසඳුම් ලබාදීම බවත්, ගරු සභාපතිතුමා මැදිහත් වී සිදු කළ නිරීක්ෂණ චාරිකාව නිසා පැවති සිදුකළ පිළියම් වලින් එම තත්ත්වයේ යම් වෙනසක්, පාලනයක් සිදුවීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිය පළ කරන බවද ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. ඉහත එපිටපැත්ත ගම්වාසීන් විසින් යොමුකර තිබූ ලිපියෙහි සඳහන් ගැටළු බොහෝමයක් මේ වන විට විසඳී ඇති බවත්, කොම්පෝස්ට් ව්‍යාපෘතිය වසා දැමීම නොව, ගැටළු විසඳා ගැනීම යෝග්‍යම ක්‍රමය බවත්, එසේම මුදල් කමිටුවේදී කොම්පෝස්ට් ව්‍යාපාතිය පිළිබඳ කළ සාකච්ඡා නිසා විශාල ආදායමක් ලබා ඇති බවද සංඛ්‍යා ලේඛන සැසඳීමේදී මෙලෙස ලාභයක් ලැබීම සතුටට කාරණායක් බව ද එතුමන් විසින් පෙන්වා දෙන ලදි.*

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා***

*ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන්ගේ උත්සාහය පිළිබඳ හා කොම්පෝස්ට් ව්‍යාපෘතිය පිළිබඳ අවධානය යොමු කිරීම පිළිබඳ ප්‍රණාමය ප්‍රකාශ කරන බවද, කොම්පෝස්ට් ව්‍යාපෘතිය අධීක්ෂණ කටයුතු පිළිබඳ සියළුම බලතල පවරා ඇති නිසා තවත් අතුරු සිදුරුවල ඇති අඩුපාඩු සකසා නගර සභාවට ලාභයක් ලැබෙන ලෙස ඉදිරියටත් කටයුතු කරන ලෙස නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි.*

**06:04 බලන්ගොඩ, රාස්සගල පාර, විදුලිබල මණ්ඩලය ඉදිරිපිට දෙමහල් නිවස අනාථ ළමුන් නඩත්තු කරන යාඥා මධ්‍යස්ථානයක් වශයෙන් පවත්වාගෙන යාමට ප්‍රදේශවාසීන්ගේ විරෝධය පළ කිරීම**

බලන්ගොඩ, රාස්සගල පාර, විදුලිබල මණ්ඩලය ඉදිරිපිට දෙමහල් නිවස අනාථ ළමුන් නඩත්තු කරන යාඥා මධ්‍යස්ථානයක් වශයෙන් පවත්වාගෙන යාමට විරුද්ධව ප්‍රදේශවාසීන් විසින් යොමුකළ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

06:14 යටතේ සාකච්ඡා කරන ලදි.

**06:05 2014 වර්ෂය සඳහා නිල ඇඳුම් සහ දීමනා ලබාදීම**

2014 වර්ෂය සඳහා නගර සභාවේ සේවයේ නියුතු නිලධාරී මහත්ම මහත්මින්ට නිල ඇඳුම් ලබාදෙන ලෙස කර තිබූ ඉල්ලීම අනුව නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි ලබාදීමටත් නිල ඇඳුම් අඳින අයට පමණක් එය නිකුත් කිරීමටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 බලන්ගොඩ, තානායම් පිවිසුම් පාර අංක 7-ඒ දරණ ගොඩනැගිල්ල සඳහා වරිපනම් බදු නිදහස් කර ගැනීම - එම්. එස්. එම්. සිල්මි**

බලන්ගොඩ, තානායම් පිවිසුම් පාර අංක 7-ඒ දරණ ගොඩනැගිල්ල සඳහා වරිපනම් බදු නිදහස් කර ගැනීම සඳහා එම්. එස්. එම්. සිල්මි යොමු කළ ඉල්ලීම අනුව වරිපනම් බදු මුදලින් 50% ක් පමණක් නිදහස් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 පළාත් පාලන ආයතන වල ගරු මහජන නියෝජිතයන් ඇතුළු සේවක මහත්ම මහත්මින් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා පාඨමාලාවට සභාවෙන් මුදල් ගෙවීමට අනුමැතිය ඉල්ලීම**

පළාත් පාලන ආයතන වල ගරු මහජන නියෝජිතයන් ඇතුළු සේවක මහත්ම මහත්මින් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා පාඨමාලාවට සහභාගි වීම සඳහා සභාවෙන් මුදල් ගෙවීමට අනුමැතිය පතමින් කර තිබූ ඉල්ලීම අනුව එම මුදල සභාවෙන් ගෙවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 මහජන පොළ ඉදිකිරීමට එරෙහිව බලන්ගොඩ දිසා අධිකරණ නඩු අංක 3089 පිළිබඳව සභාව දැනුවත් කිරීම**

මහජන පොළ ඉදිකිරීමට එරෙහිව බලන්ගොඩ දිසා අධිකරණ නඩු අංක 3089 පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව ක්‍රීඩා පිටිය සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරියට දැනුම් දීමට තීරණය කරන ලදි.

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා***

*මෙම ඉඩම් කොටස බලන්ගොඩ ප්‍රදේශයට විශාල වටිනාකමක් ඇති ස්ථානයක් බැවින් එය නගර සභාවට පවරා ගැනීමට කටයුතු කළ ගරු සභාපතිතුමාටද, ගරු ලේකම්තුමියටද, වැඩ*

*අධිකාරී යූ. වී. දැල බණ්ඩාර, නීතීඥ චන්ද්‍රසේකර හා ඩබ්. දයාරත්න මහත්වරුන්ට හා ස්ථාන මාරුවක් ලැබූ නගර සභාවේ සේවය කළ කළමනාකරණ සහකාර දිනූෂ විතාරම මහතාට ද ස්තුතිය පල කිරීම සඳහා යෝජනා කරන බවද නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් දන්වා සිටින ලදි.*

*නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී*

***ගරු සභාපතිතුමා***
*මෙම ඉඩම සඳහා හිමිකම් සහතිකයක් ලබා ගැනීමට කටයුතු කරන බවද දන්වා සිටින ලදි.*

**06:09 නිවසක වහලය සඳහා ඇස්බැස්ටොස් තහඩු ඉල්ලීම - ඩබ්. ඒ. කේ. මහේෂ් නිලූෂ**

බළන්ගොඩ, ඕලුගංතොට, පුරණෙගෙදර පාර, අංක 62/1 හි පදිංචි ඩබ්. ඒ. කේ. මහේෂ් නිලූෂ යන අය විසින් තම නිවසේ වහලය සඳහා ඇස්බැස්ටොස් තහඩු 12ක් ලබා දෙන ලෙස කර තිබූ ඉල්ලීම අනුව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමාගේ 2014 මන්ත්‍රී ප්‍රතිපාදන වලින් එම තහඩු ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 විවෘත කඩ අංක 06 - ටෙන්ඩර් තීරණය දැනුම්දීම**

බළන්ගොඩ විවෘත කඩ අංක 06 ටෙන්ඩර් කිරීම සිදු වූ අතර ඒ සම්බන්ධව විෂයභාර නිලධාරී විසින් යොමුකළ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**06:11 2015 වර්ෂයේ අයවැය සකස් කිරීම සඳහා යෝජනා ලබාගැනීම**

බළන්ගොඩ නගර සභාවේ 2015 අයවැය සකස් කිරීමට අදාළ යෝජනා ලබාගැනීමට අදාළ ලිපිය ගණකාධිකාරී විසින් ගරු සභාපතිතුමන් විසින් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**06:12 දොරින් දොරට - ගමින් ගමට ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සැලැස්ම**

ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය, ග්‍රාමීය පාලම් නවීකරණය හා අළුතින් ඉදිකිරීම් සඳහා වූ දොරින් දොරට - ගමින් ගමට ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සැලැස්ම සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් දී ඇති උපදෙස් හා මාර්ගෝපදේශ වලට අදාළව සිදු කිරීමට ද බෝම්බුව නගර සභා නිවාස අසලින් ගලාගොස් ෂලීම් මහතාගේ නිවාස අසලින් අවසන් වන වැසිජල කාණු පද්ධතිය පළාත් උපමානපාදක අරමුදල් සංවර්ධන වැඩසටහන යටතේ අනුමත සමිති මගින් ඉටු කිරීමට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය නිසා ජන ජීවිතයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව**

බළන්ගොඩ නගර සභාවේ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය නිසා ජන ජීවිතයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳව එපිටපැත්ත ගම්වාසීන් විසින් කරන ලද දැනුවත් කිරීමට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් කරන ලද පරීක්ෂණයට අදාළ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

06:03 යටතේ සාකච්ඡා කරන ලද අතර මෙම අවස්ථාවේදී ඉහත කරුණු සම්බන්ධව ප්‍රකාශයක් ලබාගැනීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට ඉඩ ලබාදීම සඳහා ගරු සභාපතිතුමා මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදි.

***මහජන සෞඛ්‍ය පරීක්ෂක***

*ඉහත කාරණයට අදාළව යම් යම් ගැටළු පවතින අතර ඒ සඳහා පහත යෝජනා ඉදිරිපත් කරන ලදි. වැසි ජලය බැස යන කාණු පද්ධතිය සකස් කළ යුතු බවද ගලි ප්‍රතිකාරක පද්ධතිය සම්බන්ධව ගැටළුව මතු වූ පසු පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමග සාකච්ඡා කළ බවත් එහි සාම්පල් 05 ක් ගත් බවද එහි ප්‍රතිඵල ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කරන බවද, ගලි ප්‍රතිකාරක පද්ධතියේ පොල් කෙඳි මේ වන විට දිරා ගොස් ඇති අතර නැවත එය ප්‍රතිසංස්කරණය කළයුතු බවත් ඒ සඳහා රුපියල් මිලියනයකට ආසන්න මුදලක් වැය වන අතර හැකි ඉක්මනින් එම කටයුතු සිදුවිය යුතු බවද වැසි ජලය ගලා යාමේ දී පෙරේන ක්‍රමයක් අනුව ජලය ඉවත යන ස්ථානය වැසී ඇති අතර එය ප්‍රතිසංස්කරණය කළ යුතු බවද, ගලි ප්‍රතිකාරක පද්ධතියේ ගන්ධය අඩු කිරිම සඳහා ඇමරිකාවේ නිෂ්පාදිත බැක්ටීරියා වර්ගයක් ගෙන්වා ගැනීම සුදුසු බව ද ප්‍රකාශ කළේය. එසේම කොම්පෝස්ට් ව්‍යාපෘතිය මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍රය ලබා ඇති බවත් එම අධිකාරියේ නිරන්තර අධීක්ෂණයට ලක් වන බවත් පෙන්වා දෙන ලදි.*

**06:14 බළන්ගොඩ, රාස්සගල පාර, අංක 90බී දරණ ඇන්තනී ජෝශප් විසින් අනුමත කළ ගොඩනැගිලි සැලැස්ම පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව**

බළන්ගොඩ, රාස්සගල පාර, අංක 90බී දරණ ඇන්තනී ජෝශප් විසින් අනුමත කළ ගොඩනැගිලි සැලැස්ම පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් අදහස් ඉදිරිපත් විය.

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*මෙම ආයතනය ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි නොකළ ආයතනයක් වන නමුත් මෙම ස්ථානය පිළිබඳ ප්‍රදේශයේ ජනතාවගේ විරෝදයක් මතුව ඇති බවත්, මෙහි සැලැස්ම අනුමත කිරීමේ දී ඒ පිළිබඳ සලකා කරුණු මොනවාදැයි ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් විමසා සිටින ලදි.*

මෙම අවස්ථාවේදී ඉහත කරුණු සම්බන්ධව ප්‍රකාශයක් ලබාගැනීමට වැඩ අධිකාරී මහතාට ඉඩ ලබාදීම සඳහා ගරු සභාපතිතුමා මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදි.

*වැඩ අධිකාරී මහතා*

*මෙම ස්ථානය පරීක්ෂා කළ බවද සැලැස්මක් අනුමත කිරීමේ දී ඉඩමේ අවම සීමාව සලකා බලන නමුත්, නීතිරීති අනුව නිවසේ විශාලත්වය පිළිබඳ ව හෝ එහි ඇතුළත විශාලත්වය පිළිබඳ සලකා බැලීමක් නොකරන බවද, නිවෙස් හිමිකරුවන්ගේ ආර්ථික තත්ත්වය මත හා ඔවුන්ගේ අවශ්‍යතාවයන් මත නිවෙස් සඳහා සැලසුම් අනුමත කරන බවද, මෙය නිවසක් ලෙස නගර සභාවේ අනුමත වී ඇති බවද, නමුත් භාවිතය වෙනස් කරන්නේ නම් සැලසුම් කමිටුවට යොමුකර ගාස්තුවක් ගෙවා භාවිතය වෙනස් කර ගත හැකි බවද, නිවසක් සඳහා අනුමත කරගෙන වෙනත් කාර්යයක් සඳහා යොදා ගන්නේ නම් එයට නීත්‍යානුකූලව කටයුතු කළ හැකි බවද වැඩ අධිකාරී මහතා විසින් දන්වන ලදි. මෙහි සැලසුම දේවස්ථානයක් ලෙස සකස් කර නොමැති බවද අනුමත සැලසුමට අනුව නිවස ගොඩනගා ඇති බවද වැඩි දුරටත් දන්වා සිටින ලදි. එසේම මෙහි භාවිතය වෙනස් කරන තෙක් මෙහි වෙනත් කටයුත්තක් සඳහා භාවිතා නොකරන ලෙස වාචිකව ද දැනුම් දුන්බව ද දන්වා සිටින ලදි.*

***ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*ඉහත කරුණ පිළිබඳ ප්‍රදේශවාසී ජනතාවගෙන් විරෝධතාවයක් මතුව ඇති බවද, ඔවුන්ගේ සැකය සාධාරණ බවට කරුණු මතුවී ඇති බවද බලන්ගොඩ නිදහස් කලාපයක් බැවින් රාජ්‍ය නොවන සංවිධාන මෙම කලාපයට ඇතුළත් වීමේ මාර්ග ලෙස මෙවැනි ආයතන පිහිටුවන බවද ඒවා පිළිබඳ අවිශ්වාසයන් මතුවන අතර ඒවා සාකච්ඡාවට ගැනීම යහපත් නමුත් අවේගශීලී නොවී ඒ සඳහා ගතයුතු සොයා බලා ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.*

***ගරු සභාපතිතුමා***

*යම් සැලැස්මක් අනුමත කිරීමේ දී වැඩ අධිකාරී විසින් එය නීත්‍යානුකූලව සිදු කරන්නේ දැයි සොයා බලන අතර මහජන සෞඛ්‍ය පරීක්ෂක එහි සෞඛ්‍ය පහසුකම් සොයා බලන බවද නාගරික සංවර්ධන අධිකාරියේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ නීතිරීති වලට අනුකූලව දැනට මෙම ස්ථානය නීත්‍යානුකූල ලෙස නගර සභාවෙහි නිවසක් ලෙස ලියාපදිංචි කර ඇති බවද නමුත් මෙහි භාවිතය වෙනස් කර ව්‍යාපාරික ස්ථානයක් ලෙස හෝ ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් අවසර ලබාගතහොත් මෙය ආගමික ස්ථානයක් බවට පත් කරන්නේ නම් නැවත සැලසුම් කමිටුවට යොමුකර ගාස්තු ගෙවා එය අනුමත කළ යුතු බවද ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.*

**06:15 සිසිල ඉන් නමින් නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාමට අවසර ඉල්ලීම වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව**

සිසිල ඉන් නමින් නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාමට අවසර ඉල්ලීම වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරනලදී. *එසේම මෙම ස්ථානය සඳහා අනවසර නියෝගයක් යවන ලෙසද නීත්‍යානුකූලව කටයුතු සිදුකිරීමට උපදෙස් ලබාදෙන ලෙසද වැඩඅධිකාරියට දන්වන ලදි.*

**06:16 HF 8558 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම**

සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටරයක් වන HF 8558 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම සඳහා රු. 167,600.00 ක ඇස්තමේන්තුවක් මුදල් කමිටුව මගින් අනුමත වී ඇතත්, අදාළ ආයතනයෙන් 50% ක අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටින බැවින් එම මුදල ගිවිසුමක් අත්සන් කර ලබාදීමට සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06෴17 ඇල්ලෙපොල ස්ථාන දෙකක බදු අයකර ගැනීම සඳහා ජංගම සේවයක් පැවැත්වීම සඳහා අවසර ඉල්ලීම**

කොට්ඨාශ අංක 01 හා 02 ආවරණය වන පරිදි බදු අය කර ගැනීමේ ජංගම සේවයක් පැවැත්වීම සඳහා විෂයභාර නිලධාරී විසින් කර තිබූ ඉල්ලීම අනුව බලන්ගොඩ ඇල්ලෙපොල දර්ශන මහතාගේ නිවස අසළද ඇල්ලෙපොල රංජනී මහත්මියගේ නිවස අසල ද බදු අය කර ගැනීමේ ජංගම සේවාවන් පැවැත්වීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06෴18 2015-2020 පස් අවුරුදු සැලැස්ම සකස් කිරීම**

2015-2020 පස් අවුරුදු සැලැස්ම සකස් කර ගැනීම සඳහා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග විමසා අදාළ විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කර ලිපියට අනුව සැලැස්ම සකස් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියට අනුව යෝජනා ලබාගෙන අදාළ කාර්යය කළයුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06෴19 කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍රය මිලදී ගැනීම සඳහා කැළණි ඒජනිසීස් ආයතනයෙන් ලබාදුන් මිල ගණන්**

කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍රය මිලදී ගැනීම සඳහා කැළණි ඒජනිසීස් ආයතනයෙන් ලබාදුන් මිල ගණන් අනුව රු. 450,000 ක මුදලකට මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06෴20 මාර්ග නඩත්තු කටයුතු කඩිනම් කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබාගැනීම**

නගර සභාව සතු මාර්ගවල නඩත්තු කටයුතු කඩිනමින් කළ යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරි ගිණුමෙන් රු. 2,000,000 ක මුදල් ප්‍රමාණයක් නගර සභා පොදු අරමුදලට බැර කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:21 ගබඩා කාමරයක් සාදා ගැනීම සඳහා ඉඩමක් ලබාදෙන ලෙස ඉල්ලීම - අවිහිංසා සහන සංවිධානය**

තම සංවිධානයට නගර සභාවෙන් පරිත්‍යාග ලෙස ලැබුණ බඩු භාණ්ඩ හා සංගමයේ භාණ්ඩ ගබඩා කර ගැනීම සඳහා කාමරයක් සාදා ගැනීමට සේනක පෙදෙස නිවාස අංක 17-23 අතර සීමාවේ සමූපාකාර මන්දිරය පිටුපස ඉඩම් කොටස ලබාදෙන ලෙස අවිහිංසා සහන සංවිධානය විසින් කර තිබූ ඉල්ලීම අනුව එවැනි ඉඩම් කොටසක් තිබේදැයි පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා දෙන ලෙස ආදායම් පරීක්ෂකට හා වැඩ අධිකාරීට පවරන ලදි.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00 ට වැඩි ගෙවීම් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

08:01 බළන්ගොඩ අනදමෙත්ගම නිවාස යෝජනා ක්‍රමයේ මැද පාර සංවර්ධනය කිරීම (සභා අරමුදල් කර්මාන්ත) රු: 250,000.00

**ග්‍රාමීය ප්‍රවේශ මාර්ග යෝජනා 2014**

08:02 පල්ලෙවෙල කුඹුර අද්දර මාර්ගය සංවර්ධනය කිරීම රු: 200,000.00

08:03 බෙලිගල මාර්ගයේ ආරම්භක කොටස සංවර්ධනය කිරීම රු: 1,000,000.00

08:04 ජනපද මාර්ගයේ ඉතිරි කොටස පඩි දමා සංවර්ධනය කිරීම රු: 500,000.00

08:05 ළහිරු ස්ටෝර්ස් අසලින් ඉහළට යන පාර කොන්ක්‍රීට් කිරීම රු: 200,000.00

08:06 කිරිදිගල තලාගොල්ල මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් ඇතිරීම රු: 400,000.00

ඉහත ඇස්තමේන්තු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර සභාවාරය සඳහා ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

### 11ඃ01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

11ඃ01ඃ01 විදුලි බල මණ්ඩලය ඉදිරිපිට ෆයිරෝස් නිවාස මාර්ගය සංවර්ධනය කර අළුත්වැඩියා කිරීම

11ඃ01ඃ02 වැවවත්ත කීර්ති මහතාගේ නිවස මාර්ගය අළුත්වැඩියා කිරීම

11ඃ01ඃ03 සුනිල් ගරාජ් අසල මාර්ගය අළුත්වැඩියා කිරීම

11ඃ01ඃ04 සඳුන්ගම ඉහළ කොටසේ මාර්ගය අබලන්ව ඇති කොටස් අළුත්වැඩියා කිරීම

ඉහත යෝජනා ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මෙම සංවර්ධන කටයුතු තුන්වන කාර්තුවේදී ක්‍රියාත්මක කරන බවද මෙවැනි සංවර්ධන කටයුතු කර්මාන්ත හා සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන ලෙස ද දන්වන ලදි. මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

11ඃ01ඃ05 බලන්ගොඩ නගර සභාව තුළ දැනට පවතින සියළු ආගමික ස්ථාන කොපමණ තිබේද? එම ස්ථාන සභාව තුළ නීත්‍යානුකූලව ලියාපදිංචි කර තිබේ ද? ලියාපදිංචි කර ඇත්නම් කිනම් වර්ෂයේ සිටදැයි විමසීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, මේ පිළිබඳ සොයා බලා මහා සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ආදායම් පරීක්ෂක මහතාට දැනුම් දෙන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 11ඃ02 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා

11ඃ02ඃ01 පහළ කුමාරගම සොහොන් පිට්ටනිය වටා වැටක් ඉදිකර ගැනීම සහ නඩත්තුව සඳහා පුද්ගලයෙකු පත් කර ගැනීම

ඉහත යෝජනාවට අනුව සොහොන් භූමියට අදාළ ඉඩමෙහි අයිතිය තහවුරු කර ගැනීමටත්, නඩත්තුව සඳහා සුදුසු අයෙකු නම් කර රු. 5000 ක දීමනාවක් ගෙවීමටත් ගරු සභාපතිතුමන් විසින් අනුමැතිය සඳහා යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

11:02:02 උඩ ඇල්ලෙපොල ශ්‍රී විසුද්ධාරාම විහාරස්ථානයේ වහල ඉදිකිරීම සඳහා ඇස්බැස්ටස් සෙවිලි තහඩු 10 ක් සහා අරමුදලින් ලබා දෙන ලෙස ඉල්ලීම

11:02:03 වැවේගෙදර මාර්ගයේ මුල හා අග කොටස් අන්තර් සම්බන්ධිත ගල් කුට්ටි ඇතිරීමේ ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලීම

11:02:04 බලගහමුල රාජා මහතාගේ ඔසුසැල අසල ඇති ප්‍රධාන බෝක්කුව ශුද්ධ කිරීම

ඉහත යෝජනා ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, මුදල් තත්ත්වය සලකා බලා එම සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

11:02:05 පසුගිය දිනක නිදහස් වූ පොළ අසල ඇති භූමි කොටස සම්බන්ධව ක්‍රියාත්මක කිරීමට අදහස් කරන කටයුතු පැහැදිලි කරන ලෙස ඉල්ලීම

මෙම භූමිය පිළිබඳ 06:08 යටතේ ක්‍රීඩා පිටිය සඳහා යොදාගන්නා බවට සාකච්ඡා කරන ලදි.

11:02:06 දොරවෙල මාගිරිස් මහතාගේ (බාසුන්නැහේ) නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම

11:02:07 අනදමෙත්ගම ජයතිලක මහතාගේ සහ තවත් අයගේ නිවෙස් වලට යන මාර්ගය සංවර්ධනය කිරීම

ඉහත යෝජනා 02 ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, මුදල් තත්ත්වය සලකා බලා එම සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 මුදල් කාරක සභා වාර්තාව

2014.07.02 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව

2014.07.02 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:03 සෞඛ්‍ය, ඝන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා වාර්තාව

2014.07.19 වන දින පැවති සෞඛ්‍ය, ඝන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:04 තානායම් කමිටු වාර්තාව

2014.07.02 වන දින පැවති තානායම් කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:05 පුස්තකාල කමිටු වාර්තාව

2014.07.08 වන දින පැවති පුස්තකාල කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:06 ඵලදායිතා කමිටු වාර්තාව

2014.07.09 වන දින පැවති ඵලදායිතා කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:06 කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව**

2014.07.09 වන දින පැවති **කළමනාකරණ කමිටු රැස්වීම්** වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

13:01 2014 ජූනි මාසය සඳහා වන ලැබීම් හාගෙවීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 9,802,819.28 |
| වෙනත් ලැබීම් | 4,197,721.75 |
| **මුළු ලැබීම්** | **14,000,541.03** |
| පුනරාවර්තන වියදම් | 7,759,352.68 |
| වෙනත් වියදම් | 3,253,104.32 |
| **මුළු වියදම්** | **11,012,457.00** |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් අදහස් ඒ සඳහා ඉදිරිපත් නොවුණි.

**13:02 2014.05.01 සිට 2014.05.31 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.06.01 සිට 2014.06.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 492,270.80 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

**14:01 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

ගියවර සභා වාරයේ දී කිසිම මන්ත්‍රීවරයෙකුගෙන් තමන්ට ප්‍රතිපාදන නොලැබුණ බව සඳහන් කළත් මේ වන විට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රංජන් රාමනායක මහතාගෙන් රු. 150,000.00 ද දිනේෂ් කන්කන්ද මැතිතුමාගෙන් රු. 50000.00 ද තලතා අතුකෝල

මැතිනියගෙන් රු. 50000.00 ද ආදි වශයෙන් තමන් විසින් යෝජනා කළ නගර සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බවද, එම ප්‍රතිපාදන ලබා දීම වෙනුවෙන් ස්තුතිය පළ කරන බවද නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. එසේම සැලූන් වල ඇති අපද්‍රව්‍ය ට්‍රැක්ටර් වලින් ලබා නොගන්නා බවට චෝදනාවක් ඇති බවද එතුමන් විසින් පෙන්වා දෙන ලදි. ඒ පිළිබඳ දැනුවත් කරන ලෙස ඉල්ලා සිටි නගර සභා ගරු මන්ත්‍රීතුමන් පසුගිය දිනවල ලැබූ ආරාධනයක් අනුව සාන්ත ඇග්නස් බාලිකා විද්‍යාලය බස් රථයක් ලබාගැනීම වෙනුවෙන් පැවැත්වූ රථවාහන සේදීමේ වැඩසටහනට සහභාගි වීමට නොහැකි වූ බවත් නමුත් ඒ වෙනුවෙන් මන්ත්‍රී වැටුපෙන් රු. 1000 ක් පරිත්‍යාග කරන බවද දන්වන ලදි.

එසේම නගරයේ දැනට පවතින ත්‍රීවිල් රථ ප්‍රමාණය අධික වීම නිසා ගැටළු සහගත තත්ත්වයක් මතුව ඇති බවද ඒ සඳහා කඩිනම් විසඳුමක් ලබා ගැනීම සඳහා සභාව මැදිහත් වන ලෙස ද ඉල්ලා සිටින ලදි.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ප්‍රකාශ කළ සැලූන් පිළිබඳ අදහස් දක්වමින් එම ආයතන පිළිබඳ සොයා බලන ලෙසද, පසුගිය දිනක දොරවෙල ඔයට සැලූන් අපද්‍රව්‍ය දමා තිබූ බවද පෙන්වා දෙන ලදි. එම නිසා ගංගාව පහළින් සිටින එහි ජලය ප්‍රයෝජනයට ගන්නා ජනතාව අපහසුතාවයට පත්ව ඇති බවද දොරවෙල ගම්මානයේ ජනතාව තම දෛනික අවශ්‍යතා සඳහා මෙම ඔය ප්‍රයෝජනයට ගන්නා බවද මෙලෙස අපද්‍රව්‍ය ජලයට එක් කරන පුද්ගලයන් වෙනුවෙන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි.

එසේම ඉත්තෑකැලේ ප්‍රදේශයේ ජනතාව දැඩි ජල අපහසුතාවයකින් පෙළෙන බවත් ජල ටැංකියක් සාදා ගඟෙන් ජලය පොම්ප කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසද, මුගුණමලේ හා බණ්ඩාරවත්ත ප්‍රදේශවලට ඉවතලද අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ට්‍රැක්ටරය යවන ලෙස ද, ජනපද පාර, රත්ඹිවිට පාර ද සුදර්ශනගම ප්‍රදේශය සඳහා ද සතියකට වතාවක් හෝ කුණු ගැනීම සඳහා ට්‍රැක්ටරය යවන ලෙසද එසේ නොහැකියාවක් ඇත්නම් කුණු දැමීම සඳහා කණුවක් සිටුවා දෙන ලෙසද එතුමන් විසින් ඉල්ලා සිටින ලදි. එසේම හැකි ප්‍රදේශ සඳහා ට්‍රැක්ටරය යවන ලෙසද ගැටළු මතුවුවහොත් ඒ සඳහා වගකීම භාර ගන්නා බවද ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

**14:03 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

පාර්ලිමේන්තු හා පළාත් සභාවල මන්ත්‍රීතුමන්ලාට වඩා වගකීමෙන් නගර සභා මන්ත්‍රීවරුන් කටයුතු සිදු කරන බව සඳහන් කළ ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් සභාවේ ගැටළු සභාව තුළ විසඳාගෙන ජනතාවට නිවැරදි දේ ලබාදීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.

එසේම මාස කීපයකට පෙර රජවක කෘෂිකර්ම මධ්‍යස්ථානයේ දී පියතිස්ස රණසිංහ මහතා විසින් සිදුකළ වැඩමුළුවක් සඳහා සහභාගි වූ බවත් එහිදී ලබාදුන් රහස් පෝරමයක නිලධාරීන් වැඩි පිරිසක් පරිපාලනමය වෙනස් ක්‍රමයක් සිදු වියයුතු බවට අදහස් පළකර තිබූ බවත්, කාලයක් ගතවන විට ඒකාකාරී බව වෙනස් කිරීමට කටයුතු කළයුතු බව හා ඒ පිළිබඳ සොයා බලා ගතයුතු ක්‍රියාමාර්ග ගන්නා ලෙසද ගරු සභාපතිතුමාගෙන් ද ගරු ලේකම්තුමියගෙන් හා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් යෝජනා කර සිටින ලදි. එම කාරණය නිවැරදි ආකාරයට තේරුම් ගන්නා ලෙසද එතුමන් විසින් දන්වන ලදි.

එසේම පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීමේදී ඇති ගැටළු සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසද ගැටළු මතුනොවන ලෙස කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කිරීමටද ගරු උපසභාපතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි. එසේම රජයේ නියෝජිතයෙක් ලෙස යම් ආයතනයකට ගියහොත් යම් බලපෑමක් සිදුකර සේවයක් ලබාගැනීමේ හැකියාව සීමා සහිත වී ඇති බවද, එම නිසා රජයේ පිරිහීමක් සිදුවන බවද එය අවම කිරීමට කටයුතු කළ යුතුබවද පෙන්වා දෙන ලදි.

ලංකාදීම පුවත්පතේ සඳහන් වූ පූජදාස මහතාගේ ලිපියක් අනුව එහි සඳහන් කරුණු සභාවේ සාකච්ඡා විය යුතු බවද මීට වසර ගණනකට ඉහතදී සම්බන්ධීකරණ රැස්වීම් වලදී සාකච්ඡා කර ගත් දෙයක් වූවත්, විදුලිබල මණ්ඩලය පිළිබඳ ප්‍රශ්නයක් මතුව ඇති බවද සියළුම විදුලිය සම්බන්ධ කටයුතු වලදී කහවත්ත විදුලිබල මණ්ඩල ශාඛාවට යා යුතු බවද එම නිසා දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව දැඩිලෙස පීඩාවට පත්ව ඇති බැවින් විදුලිබල ගරු ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය දැනුවත් කර විදුලිය උපපොළක් බළන්ගොඩ නගරය තුළ ඇතිකර ගැනීමට යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදි.

එසේම ව්‍යාපාරික ෆලීල් මුදලාලි පිළිබඳ විවිධ විවේචන පළ වුවද නගර සභාවට ඔහු විශාල බදුමුදල් ප්‍රමාණයක් ගෙවා ඇති බවද ඔහුගේ අභාවයට නගර සභාව වෙනුවෙන් ශෝකය පළ කරන බවද ගරු උපසභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි. එසේම නගර සභාවට අලුතෙන් බඳවා ගත් අධ්‍යාපන සුදුසුකම් ඇති යමක් කළ හැකි තරුණ පිරිසක් බවත්, ඔවුන්ට වගකිව යුතු රාජකාරියක් පවරා දෙන ලෙසද, ඔවුන්ගේ සේවය ඉදිරියේදී වැඩි වැඩියෙන් ප්‍රයෝජනයට ගන්නා ලෙසද ඉල්ලා සිටි ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ලංකාවේ විශිෂ්ටතම නගර සභාවේ සභාපතිතුමන් සමග ගැටෙන බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක හා කටයුතු කිරීමේ දී දැනුම වැඩිවන බවත් ඔවුන් සමග කටයුතු කිරීම සතුටට කාරණයක් බවත්, ඒවා වැරදි ලෙස අර්ථකථනය කර නොගන්නා ලෙසද ආගමික කටයුතු වලදී අන්තවාදී නොවන අතර සියලුම ජනතාව සහයෝගයෙන් ජීවත් විය යුතු බවත් ජාතිවාදය අවුස්සා බළන්ගොඩ විනාශ කිරීමට කටයුතු නොකරන වගකිව යුතු ජනතා සේවයක් ලෙස කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

**14:04 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා**

බළන්ගොඩ නගර සභාව ප්‍රදේශවාසී සියළුම දෙනාට ආඩම්බරයක් බවද, මෙහි මන්ත්‍රීවරයෙකු වීම සතුටත් බවද සඳහන් කළ නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් නගරයේ වැසිකිළි 10, 15ත් දිනකට උතුරා යන බවද නගරයේ හදවත වන් වූ කොම්පෝස්ට් ව්‍යාපෘතිය රැකගැනීමට කටයුතු කළ යුතු බවත්, සියළුම දෙනා එක්ව සාකච්ඡා කර එහි අඩුපාඩු හැකි ඉක්මනින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළයුතු බවත්, 2015 මන්ත්‍රී ප්‍රතිපාදන සියල්ල කොම්පෝස්ට් ව්‍යාපෘතියට යොදවා නැවත එය සකසා ගත යුතු බවත්, මෙම කොම්පෝස්ට් ව්‍යාපෘතිය අසාර්ථක වුවහොත් මුළු බළන්ගොඩ නගරයම විනාශ වන බවත් පෙන්වා දෙන ලදි.

අනෙකුත් සංවර්ධන කාර්යයන් වලට වඩා වැඩි ප්‍රතිපාදන මේ සඳහා වැයකර බළන්ගොඩ නගරය දර්ශනීය නගරයක් ලෙස තව තවත් වැඩිදියුණු කළ යුතු බවද, පසුගිය රාමසාන් උත්සව සමයේ ජල ගැටළුවට මැදිහත් වී ජල බවුසර මගින් ජලය ලබාදීම හා අක්‍රීය වීදි පහන් සකස් කර ආගමික කටයුතු සඳහා අවශ්‍ය පරිසරය සකසා දීම වෙනුවෙන් බළන්ගොඩ මුස්ලිම් ජනතාවගේ ස්තුතිය ගරු සභාපතිතුමාට, නිලධාරී මණ්ඩලය හා සේවක මහතුන්ට පළ කරන බවද නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂ මැතිතුමා**

උපසභාපතිතුමන් පැවසූ ආකාරයට විදේශ මුස්ලිම් රටවල් මෙරට මුස්ලිම් ජනතාවට ආධාර ලබාදෙන බවද රටේ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් බොහෝ කටයුතු සිදුකරන බවද නමුත් එම රටවලට යාමට හැක්කේ වීසා ලබාගෙන බවත් එය අවසන් වූ වහාම නැවත උපන් බිමට පැමිණිය යුතු බවත්, කෙසේ හෝ ජනතාවට සැලසෙන සහන පිළිබඳ සතුටුවන අතර රට සංවර්ධනය කරා ගමන් කිරීම වැදගත් බවත් නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂ මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

එසේම මානව හිමිකම් පිළිබඳ අතිගරු ජනාධිපතිතුමාට චෝදනා එල්ලවුවත්, නීතිය කාටත් පොදුවී ඊශ්‍රායල් අගමැතිටද යුධ අධිකරණයට ගෙනයා යුතු බවද ඒ සඳහා හඬක් නැගිය යුතු බවද ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අත්සන් කළ ගිවිසුම නිසා ගරු ජනාධිපතිතුමන් යුධ අධිකරණය ඉදිරියට ගෙනයා නොහැකිබව ද එතුමන් විසින් වැඩි දුරටත් පෙන්වා දෙන ලදි.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ජාතිවාදී ප්‍රශ්න මේ වන විට උග්‍රව ඇති බවද ඒවා විසඳාගැනීමට කටයුතු කළයුතු බවද සඳහන් කළ නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් බළන්ගොඩ සිංහල ජනයා එම්. එල්. එම් අබුසාලි මැතිතුමා ජනතා නායකත්වයට පත්කිරීමට තරම් සාමකාමී ජනතාවක් බළන්ගොඩ ජීවත් වූ බව පෙන්වා දෙන ලදි.

එසේම විශාල සංවර්ධන ව්‍යාපෘති ලංකාවේ සිදුවන දක්නා ලද බව සඳහන් කළ ගරු මන්ත්‍රීතුමන් විසින් පල්ලෙකුඹුර මාර්ගය නවීකරණය කර දෙන ලෙසද JCB යන්ත්‍රය අළුත්වැඩියා කරගැනීමට කටයුතු කරන ලෙසද දන්වා සිටින ලදි. ජනතාව වෙනුවෙන් පොරොන්දු ලබා දෙන බවද ඒවා නිසිලෙස ඉටුකරන බවද ඒ සඳහා සියළු දෙනාටම ශක්තිය ධෛර්ය ලැබේවා යයිද එතුමන් විසින් ප්‍රාර්ථනා කරන ලදි.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිනි වැවේගෙදර මැතිතුමා සඳහන් කළ සැලූන් වලින් කුණුකසල නොගන්නා බවට වූ චෝදනාවට පිළිතුරු දෙමින් සතියකට එක් වතාවක් එම කුණුකසල ට්‍රැක්ටර් මගින් ලබා ගන්නා බවද, කොන්ඩා කැබලි එකතු කර තැබීම සඳහා බෑග් ලබා දී ඇති බවද ගරු සභාපතිතුමන් විසින් පැහැදිලි කරන ලදි.

නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට කුණු දැමීම සඳහා කණු සිටවූ විට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ජනයාද ඒවාට කුණු දමන බවද, ඉදිරියේදී අපද්‍රව්‍ය දැමීම සඳහා ප්ලාස්ටික් බාල්දි පරිත්‍යායක් ලැබෙන අතර ඒවා ලබාදීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන

ලෝකයේ ජීවත් වීමට සුදුසු ප්‍රශස්තතම නගර 10ට බළන්ගොඩ නගරයද එක්ව ඇතිබවද, අන්තර්ජාලයේ මෙය සඳහන්ව ඇති බවද, බළන්ගොඩ නගර සභාව නිසා මේ තත්ත්වයට පත්ව ඇති බවද පිරිසිදුකම නිසා මෙම මට්ටමට පැමිණි බවද, පවත්වන සියළුම තරගයන් සඳහා රජයේ ආයතනයක් ලෙස මුහුණ දී ජයග්‍රහණයන් ලබාගන්නා නිසා මේ තත්ත්වයට පත්වීම ආඩම්බරයක් බව ද ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.

එසේම නගර සභාවක් ලෙස යම් යම් ව්‍යාපෘති වලින් ලාභ ලබන අතර එයින් එකක් හෝ දෙකක් අසාර්ථක වන බවද, තානායමේ එක් මාසයක අලාභයක් සිදුවීම පුවත්පත්වල පළවූ බවද නමුත් පසුගිය මාසයේ ලක්ෂ 05 ක ලැබූ ලාභය පුවත්පත් වල පළ නොවීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ

කරන බවද කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සේවය කළ සේවකයන් 05 දෙනෙක් සේවයේ ස්ථිර කර ඇති නිසා සහා මුදල් වැටුප් සඳහා වැය නොවන බවත්, අඩුපාඩු සකසා ගනිමින් එය නැවත සංවර්ධනය කර ගැටළු අවම කර ගැනීමට කටයුතු කරන බවත් මේ සියලුම ක්‍රියාමාර්ග තුළින් ජනතාව වෙත යහපත් සේවාවක් සැලසීම අවසාන අරමුණ බවත් ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 2.00ට අවසන් කරන ලදී

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,

සභාපති,
බළන්ගොඩ නගර සභාව.